අතර, අංක 77/2 දරණ ආදයම් ආරක්ෂණ නියෝගය අනුව අළුත්ම තීරුබදු ව්‍යුහයක් ප්‍රකාශ කෙරුණි. සියයට 5 හේ සිට සියයට 100 දක්වා දිවෙන මූලික තීරුබදු මට්ටම් 5 ක් අලුත් ව්‍යුහය විසින් හඳුන්වා දුනි. අඩුම බදු අනුපාත හෝ බද්දෙන් තොර ආනයන, දේශීයව නිෂ්පාදනය නොකරන අමු ද්‍රව්‍ය සඳහා යොද ඇති අතර, අනෙක්වා සඳහා ඉහළ බදු අනුපාත යොද ඇත. විශේෂයෙන් ගුණයෙන් දුර්වල දේශීය නිෂ්පාදිත ඇති විට ඒ හා සමාන භාණ්ඩ ඉහළ තීරුබදු අනුපාතික යටතේ ආනයන කිරීමට ඉඩ හැර ඇත. රුපියලේ ක්ෂය වීම සහ ඉහළ නැව් ගාස්තු සැලකිල්ලට ගත් කල දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහා මෙම පියවරයන් සෑහෙතියි සලකනු ලැබිය. ඇත්තෙන්ම, ආනයනයන් (ඉතා ඉහළ මිලකට) පැමිණීම දේශීය නිෂ්පාදනයන්ගේ භාණ්ඩවල ගුණය වැඩි කිරීමට සානුබලයක් වේ යයි අපේක්ෂා කරණ ලදී. ආනයන ලිහිල් කිරීම නිෂ්පාදනය ව්‍යාප්ත කිරීමට හේතු වේ යයි අපේක්ෂා කරන ලදී. වෙනත් වචනවලින් කිවහොත්, දුෂ්කරවූ ප්‍රමාණාත්මක ආනයන පාලන-යන්ගෙන් මිදී තීරුබදු ව්‍යුහය මගින් කෙරෙන සරල පාලනයකට හැරෙන උපනතියක් මෙයින් පෙන්නුම් කෙරේ.

නව තීරුබදු ව්‍යුහය අඛණ්ඩ සමාලෝචනයකට භාජන කිරීම සඳහා තීරුබදු සමාලෝචන කමිටුවක් පත් කළ අතර, ස්ථිර තීරු බදු කොමිසමක් පත් කිරීම පිළිබඳ අපේක්ෂාවක් පවතී. එවක් පටන් ඉහත කී කමිටුව විසින් තීරුබදු වල ඇතැම් ආන්තික වෙනස් කිරීම් කර ඇත. සුබෝපභෝගී භාණ්ඩ කීපයක් සඳහා සියයට 500 ක තීරුබදු නියම කිරීම මින් ඉතා වැදගත් කරුණකි. අපනයන අංශය දෙස බලන විට, නොවැම්බරයේදී කරන ලද විනිමය අනුපාත ඒකාංගිකරණය නිසා තේ, රබර්, පොල් යන ප්‍රධාන අපනයන භාණ්ඩ නිෂ්පාදකයන්ට අන-පේක්ෂිත ලාභ ලැබීමට ඉඩ තිබූ නිසා රජය තේ රබර් සඳහා වූ අපනයන තීරුබදු වැඩි කිරීමෙන් සහ පොල් සඳහා නව අපනයන තීරුබද්දක් දැමීමෙන් එම ලාභ ඉවත් කළේය. නමුත් මෙම ප්‍රධාන කර්මාන්තයන් සඳහා සෑහෙන දිරිගැන්වීමක් අවශ්‍ය විය හැක. ඒ නිසා ආර්ථිකයේ මෙම ප්‍රධාන අංශයන්ගේ ආර්ථික රඳා පැවැත්ම සඳහා නිරන්තරව තීරු බදු පිළිබඳ පරීක්ෂා කාරිත්වයෙන් සිටීම අවශ්‍ය විය හැක.

අපනයන නගාසිටුවීමේ අදහසින් ශ්‍රී ලංකා මහ බැංකුව 1977 ජනවාරි මාසයේදී අපනයන ඇසුරුම් ණය සහතික ක්‍රමයක් හඳුන්වා දුනි. සම්ප්‍රදායික නොවන අපනයන සම්බන්ධයෙන් බැංකු විසින් නැවගත කිරීමට ප්‍රථම දෙනු ලබන අත්තිකාරම් (ඇසුරුම් ණය) පිළිබඳ වඩාත් ලිහිල් ක්‍රියා මාර්ගයක් ගෙන යාමට වාණිජ බැංකු උනන්දු කරවීම සඳහා එම ණය මහ බැංකුව විසින් මෙම ක්‍රමය යටතේ සහතික කරනු ලැබේ. අපනයනකරු ණය නොගෙවා පැහැර හැරියහොත්, හෝ ණය ගෙවීමට ශක්තියක් නොතිබුණහොත් එමගින් බැංකුවලට වන පාඩුවෙන් තුනෙන් දෙකක් මහ බැංකුව විසින් ගෙවනු ලැබේ. මෙම ණය සහතික ක්‍රමය සියලුම අපනයන ණය සඳහා දික් කරන නව සහතික ක්‍රමයක් දනට සකස් කරගෙන යනු ලැබේ.

## ගෙවුම් තුලනය හෙවත් ශේෂය[1]

මීට පෙර සඳහන් කළ පරිදි, 1977 දී වෙළඳ අනුපාතය සැලකිය යුතු ලෙස දියුණු වීම හේතු කොට ගෙන 1965 න් පසු ප්‍රථම වරට ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුමෙහි අතිරික්තයක් වාර්තාගත විය. ඇත්ත වශයෙන්ම, 1965 දී ඇතිවූ අතිරික්තය වුවද, 1957 සිට දිගු කලක් පැවති හිඟයන් අතර වූ එකම විශේෂය විය. 1977 දී ඇතිවූ වෙනසද එපරිද්දෙන්ම වැදගත් වේ. ජංගම ගිණුමෙහි හිඟය 1975 දී රුපියල් දශ ලක්ෂ 772 ක්වූ අතර, එය 1976 දී රුපියල් දශ ලක්ෂ 50 දක්වා අඩුවෙමින් ගෙවුම් තුලනය ශක්තිමත් ලෙස වර්ධනය විය. 1977 දී මෙම

1. ගෙවුම් තුලනයෙහි හෙවත් ශේෂයෙහි යොදගෙන ඇති වෙළඳ දත්තයන්ගෙන් දක්වෙන්නේ වර්ෂය තුල සිදුවූ ලැබීම් හා ගෙවීම්ය. මෙම දත්තයන් අපනයන සහ ආනයනයන්ගේ ද්‍රව්‍යමය චලනය නිරූපනය කරන, මීට ඉහත දක්වූ විදේශීය වෙළඳ දත්තයන්ගෙන් වෙනස් වේ. එම වෙනසට හේතුව නම්, එක් අතකින් ලැබීම් සහ ගෙවීම් ද, අනික් අතින් භාණ්ඩයන්ගේ ද්‍රව්‍යමය චලනයද අතර පවත්නා වෙනසයි. ගෙවුම් තුලනයෙහි (සේවා සහ සංක්‍රාමද ඇතුලත් වන) විදේශීය වෙළඳ අංශය වැදගත් වන තරමට ගෙවුම් තුලනයෙහි වෙනස්වීම් වලට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ විදේශීය වෙළඳ උපනතීන්ය.

හිඟය මීට පෙර නොවූ පරිදි රුපියල් දශ ලක්ෂ 1,259 ක අතිරික්තයක් බවට හැරවුනි. තවද, දීර්ඝකාලීන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් තියුණු ලෙස වැඩිවීම හේතු කොට ගෙන රුපියල් දශ ලක්ෂ 2,013 ක අතිරික්තයක් ඇති කරමින් මූලික ශේෂය වර්ධනය විය. මෙම වෙනස්වීම පහත දැක්වෙන 12 වන සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

**12 වෙනි සංඛ්‍යා සටහන**

**ගෙවුම් ශේෂය - 1968 - 1976**

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | වෙළඳ ශේෂය | ශුද්ධ අදෘශ්‍යයන් | සංක්‍රාම ගෙවීම් | ජංගම ගිණුම් ශේෂය | දිගුකාලීන ප්‍රාග්ධනය (ශුද්ධ) | මූලික ශේෂය |
|---|---|---|---|---|---|---|
| 1968 .. | - 380 | + 10 | + 15 | - 355 | + 224 | - 131 |
| 1969 .. | - 746 | - 90 | + 39 | - 797 | + 275 | - 522 |
| 1970 .. | - 315 | - 104 | + 69 | - 350 | + 184 | - 165 |
| 1971 .. | - 287 | - 14 | + 85 | - 216 | + 404 | + 188 |
| 1972 .. | - 255 | - 15 | + 74 | - 196 | + 292 | + 96 |
| 1973 .. | - 299 | + 53 | + 85 | - 161 | + 190 | + 29 |
| 1974 .. | - 1,263 | + 76 | + 280 | - 907 | + 298 | - 609 |
| 1975 .. | - 1,421 | + 89 | + 560 | - 772 | + 613 | - 159 |
| 1976 .. | - 709 | + 112 | + 547 | - 50 | + 715 | + 665 |
| 1977* .. | + 490 | + 219 | + 550 | + 1,259 | + 754 | + 2,013 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* තාවකාලිකය.

ජංගම ගිණුමෙහි වර්ධනයට මූලික හේතුව වූයේ වෙළඳ තුලනයෙහි හෙවත් ශේෂයෙහි පසුගිය වසරේ වූ රුපියල් දශ ලක්ෂ 709 ක හිඟයට ප්‍රතිවිරෝධී ලෙස 1977 දී රුපියල් දශ ලක්ෂ 490 ක අතිරික්තයක් ඇතිවීම වේ. 1956 න් පසු ප්‍රථම වතාවට වෙළඳ තුලනයෙහි අතිරික්තයක් ඇතිවූ අවස්ථාව මෙය වේ. වෙළඳ අතිරික්තය, රුපියල් දශ ලක්ෂ 6,640 ක්වූ අපනයන ඉපැයීම්වල සහ රුපියල් දශ ලක්ෂ 6,150 වූ ආනයන වියදම්වල ප්‍රතිඵලය විය. චාරය, ප්‍රවාහන සහ රක්ෂණ සේවා, සංචාර සහ ලාභ, පොලී සහ ලාභාංශ යන ගනුදෙනු දැක්වෙන සේවා ගිණුම (අදෘශ්‍යයන්) රුපියල් දශ ලක්ෂ 822 ක ලැබීම් ද, රුපියල් දශලක්ෂ 603 ක ගෙවීම් ද, පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 219 ක අතිරික්තයක් නිරූපනය කළේය. එම අතිරික්තය 1976 දී රුපියල් දශලක්ෂ 112 ක් විය. පොලී ගෙවීම් සහ නැව් ගාස්තුවල වැඩිවීම ඉක්මවා යන පරිදි සංචාර, නැව් සහ ගුවන් යානා වලට ඉන්ධන සැපයීම් යන සේවාවලින් ලද ආදායමෙහි වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන, 1973 සිට නොකඩවාම සේවා ගිණුමෙහි අතිරික්තයක් දක්නට ලැබිණි. සමස්ථයක් වශයෙන් වෙළඳ සහ සේවා ගිණුම 1977 දී රුපියල් දශ ලක්ෂ 709 ක අතිරික්තයක් වාර්තා ගත කළ අතර, පසුගිය වසරෙහි දී එම ගිණුමෙහි රුපියල් දශ ලක්ෂ 597ක හිඟයක් පැවතිණි. නිළ පරිත්‍යාග සහ පෞද්ගලික මුදල් එවීම් වශයෙන් පෙන්නුම් කරන සංක්‍රාම ගෙවීම් පසුගිය වසරෙහි මෙන්ම රුපියල් දශ ලක්ෂ 550 ක අතිරික්තයක් පෙන්නුම් කෙරිණි. නිළ පරිත්‍යාග රුපියල් දශ ලක්ෂ 490 ක්වූ අතර, විදේශවල සිටින ලාංකිකයන් වැඩි වශයෙන් මුදල් එවීම හේතුකොට ගෙන පෞද්ගලික සංක්‍රාමයන්ගේ ශුද්ධ ලැබීම රුපියල් දශ ලක්ෂ 60 ක් විය.

දීගු කාලීන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් (ණය ආපසු ගෙවීම් අඩු කළ විට) 1977 දී රුපියල් දශ ලක්ෂ 754 ක්වූ අතර, එය පසුගිය වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 715 ක් විය. මෙම ලැබීම් හේතු කොට ගෙන 1976 දී රුපියල් දශ ලක්ෂ 665 ක්වූ මූලික ශේෂය 1977 දී රුපියල් දශ ලක්ෂ 2,013 ක් දක්වා වැඩිවිය. මෙම වාසිදායක තත්ත්වය නිසා මෙරට විදේශීය වත්කම් 1977 වර්ෂයේදී තියුණු ලෙස වැඩිවිය.

අපනයන ඉපැයුම්වල රුපියල් වටිනාකම 1976 දී දශලක්ෂ 4,707 සිට 1977 දී රුපියල් දශ ලක්ෂ 6,640 ක් දක්වා වැඩිවුනේය. මෙය සියයට 41 ක වැඩිවීමකි. එහෙත් වි. හැ. අ.[1] ඒකක අනුව අපනයන ඉපැයුම් වල වර්ධනය සියයට 34 ක් පමණි. ඉහත දක් වූ පරිදි 1977 දී අපනයන මිල සියයට 60 කින් වැඩිවූ අතර අපනයන පරිමාව සියයට 8 කින් අඩුවිය. මේ අනුව අපනයන ඉපැයුම් වැඩිවීමට මුලුමනින්ම හේතු වූයේ වර්ෂය තුලදී ජාත්‍යන්තර මිල ගණන් වඩා වාසිදයක අතට හැරීම වේ. වැවිලි අංශයේ ලැබීම්වල වර්ධනයට සම්පූර්ණයෙන්ම හේතු වූයේ මිල ඉහළ යාම බව පෙනේ. අනෙකුත් අපනයනවල ඉපැයුම් වැඩිවීමට මිල ගණන් මෙන්ම පරිමාවේ වැඩිවීම ද හේතු විය. මුලු අපනයන ඉපැයුම්වල වර්ධනයෙන් සියයට 73 කටම හේතු වූයේ තේ අපනයනයන්ය.

ආනයන ගෙවීම්වල රුපියල් වටිනාකම 1976 දී රුපියල් දශ ලක්‍ෂ 5,417 සිට 1977 දී රුපියල් දශ ලක්‍ෂ 6,150 දක්වා සියයට 14 කින් වැඩිවිය. එහෙත් එම ගෙවීම් වි.හැ.අ. ඒකක අනුව ගණනය කරන විට සියයට 10 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ආනයන ගෙවීම් වැඩිවීමට හේතු වූයේ ආනයන මිල ගණන් සියයට 23කින් වැඩිවීම සහ ආනයන පරිමාව සියයට 29 කින් වැඩිවීම වේ. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සහල්, සීනි, පිටි ඇතුලු ආහාර ආනයනයන්ය. එම ආහාර තුන් වර්ගය වෙනුවෙන් වැය කළ ප්‍රමාණය 1977 දී සියයට 44 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. ආනයන පරිමාවෙහි සියයට 61 ක වැඩිවීම ඊට හේතු වූ අතර මිල ගණන් සියයට 17 කින් අඩුවීම නිසා එහි බලපෑම තරමක් අඩුවිය. ඛණිජ තෙල් සඳහා වන ආනයන වියදම 1976 වර්ෂයට වඩා සියයට 25 කින් වැඩි වූ අතර, රෙදිපිළි හා මෝටර් රථ සියයට 59 කින් සහ සියයට 33 කින් පිළිවෙලින් වැඩිවිය.

සේවා ගණුදෙනු සහ සංක්‍රාම ගෙවීම් වල අතිරික්තය 1976 දී රුපියල් දශ ලක්ෂ 660 සිට 1977 දී රුපියල් දශ ලක්‍ෂ 769 දක්වා සියයට 17 කින් වැඩිවිය. පසුගිය වර්ෂ වල මෙන්ම සංචාරක ව්‍යාපාරයේ දළ විදේශ විනිමය ඉපැයුම් 1976 දී රුපියල් දශ ලක්‍ෂ 198 සිට 1977 දී රුපියල් දශ ලක්‍ෂ 267 දක්වා සියයට 35 කින් වැඩිවිය. වරාය, ප්‍රවාහන සහ රක්ෂණ සේවාවල දළ ලැබීම් 1976 දී රුපියල් දශ ලක්‍ෂ 215 සිට 1977 දී රුපියල් දශ ලක්‍ෂ 238 දක්වා වැඩි වූ අතර, ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නැව් සහ ගුවන් යානාවලට වැඩි වශයෙන් ඉන්ධන සැපයීමයි. වැඩෙන විදේශීය වත්කම් ආයෝජන ඉහළ යාම හේතු කොට ගෙන පොලී ඉපැයීම් 1976 දී රුපියල් දශ ලක්‍ෂ 33 සිට 1977 දී රුපියල් දශ ලක්‍ෂ 102 දක්වා වැඩිවිය. අනෙක් අතට විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් රුපියල් දශ ලක්‍ෂ 190 සිට රුපියල් දශ ලක්‍ෂ 235 දක්වා සියයට 24 කින් වැඩිවිය.

දිගුකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් වර්ෂය තුලදී වැඩිවිය. දළ ප්‍රාග්ධන ලැබීම් රුපියල් දශ ලක්‍ෂ 1,184 ක්වූ අතර, එය යෝජනා ක්‍රම ණය රුපියල් දශ ලක්‍ෂ 379 කින්ද, භාණ්ඩ ණය රුපියල් දශ ලක්‍ෂ 342 කින්ද, ආහාර ආධාර රුපියල් දශ ලක්‍ෂ 269 කින්ද, වෙනත් ආධාර රුපියල් දශ ලක්‍ෂ 194 කින්ද, සමන්විත විය. ණය ආපසු ගෙවීම් රුපියල් දශ ලක්‍ෂ 430 ක්වූ අතර, මේ අනුව ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් රුපියල් දශ ලක්‍ෂ 754 ක් විය.

යහපත් ගෙවුම් තත්ත්වය නිසා කෙටිකාලීන ණය සහ සැපයුම් කරුවන්ගේ ණය 1976 දී රුපියල් දශ ලක්‍ෂ 1,266 සිට 1977 දී රුපියල් දශ ලක්‍ෂ 360 දක්වා අඩුවිය. කෙටිකාලීන නොව, වැඩි වශයෙන් දිගු කාලීන ණය ලබා ගැනීමෙ උපනතියක් 1975 සිට දක්නට ලැබුණු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශ ණයවල කල්පිරීමේ රටාව මෑත අවුරුදු වලදී වඩා දික්වී ඇත.

---

1. විශේෂ හැරගැනීමේ අයිතිවාසිකම් යනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් හඳුන්වා දෙනු ලැබ ඇති ජාත්‍යන්තර සංචිත වත්කමකි. ජාත්‍යන්තර මුදල් ගනුදෙනු වලදී ගිණුම් ඒකකයක් වශයෙන් එම වත්කම බහුල ලෙස වර්තමානයේදී භාවිතා වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කරන ලද ගණුදෙනු වලින් 1977 දී රුපියල් දශ ලක්‍ෂ 718 ක ශුද්ධ සම්පත් ලැබීමක් සිදුවිය. දළ හැර ගැනීම් රුපියල් දශ ලක්‍ෂ 937 ක්වූ අතර ආපසු ගෙවීම් රුපියල් දශ ලක්‍ෂ 219 ක් විය. විශේෂ හැර ගැනීම් ඒකක දශ ලක්‍ෂ 93 ක් සඳහා වූ සම්පස්ථ ණය ගිවිසුමක් 1977 අගදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කර ගන්නා ලදී. එම ණය මුදලින් විශේෂ හැර ගැනීම් ඒකක දශ ලක්‍ෂ 55 ක් දෙසැම්බර් මාසයේ දී ලබා ගන්නා ලදී.

ගෙවුම් තුලනයේ වාසිදයක තත්ත්වය සහ රුපියලෙහි වටිනාකම අඩුවීමෙන් වත්කම්හි වටිනාකම නැවත අගය කිරීම නිසා, දළ විදේශීය වත්කම් 1977 අවසානය වනවිට හතර ගුණයකින් වැඩිවිය. එම වත්කම්වල වටිනාකම රුපියල් දශ ලක්‍ෂ 4,171 කින් හෙවත් රුපියල් දශ ලක්‍ෂ 5,574 දක්වා වැඩිවී ඇත. එසේ වුව ද, වඩා ස්ථායීවන වි. හැ. අ. ඒකක අනුව ගණනය කළ විට, දළ වත්කම් 1976 අගදී වි. හැ. අ. දශ ලක්‍ෂ 137 සිට 1977 අග දී වි. හැ. අ. දශ ලක්‍ෂ 306 දක්වා වැඩි වූ අතර එය පසුගිය වර්ෂයට වඩා දෙගුණයකටත් වඩා වැඩිවීමකි. එම වැඩිවීමට අනුකූලව ශුද්ධ විදේශීය වත්කම් ද වර්ධනය විය. 1976 අග වනවිට පැවති දළ විදේශීය වත්කම් 1977 අවුරුද්දේ මාස 2½ ක ආනයන ගෙවීම් පියවීමට ප්‍රමාණවත් විය. 1977 අග වනවිට පැවති වත්කම් ප්‍රමාණය 1978 වර්ෂය සඳහා ගණන් බලා ඇති ආනයන වලින් මාස 4 ක ආනයන පියවීමට සෑහෙන ප්‍රමාණයකි.

1977 දී ශ්‍රී ලංකා රුපියලෙහි විනිමය අනුපාතිකය නිතර වෙනස් කිරීම සහ ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ග සියල්ලකම වාගේ වටිනාකම වරින්වර වෙනස්වීම නිසා පෙර වර්ෂවලට සාපේක්‍ෂව ගෙවුම් තුලන දත්තයන් ගණනය කිරීම බරපතල ප්‍රශ්නයක් විය. ස්ථායී මුදල් ඒකකයක් නොමැතිකම නිසා සාපේක්‍ෂ වශයෙන් වඩා ස්ථායි වන වි. හැ. අ. ඒකක අනුව බර තැබූ සාමාන්‍ය වටිනාකම පහත දැක්වෙන සටහනෙහි යොදා ඇති අතර, එම සංඛ්‍යා සටහනින් පසුගිය වර්ෂ තුනෙහි සමස්ත ගෙවුම් තත්ත්වය විග්‍රහ කෙරේ.

**13 වැනි සංඛ්‍යා සටහන**

**විදේශීය සම්පත් පරතරය පියවීම – 1975/77**

| | රුපියල් දශ ලක්ෂ | | | වි. හැ. අ. දශ ලක්ෂ[1] | | |
|---|---|---|---|---|---|---|
| | 1975 | 1976 | 1977 | 1975 | 1976 | 1977 |
| 1· **විදේශ ඉපැයීම** .. | **4,538** | **5,459** | **7,582** | **538** | **561** | **742** |
| 1·1 අපනයන .. | 3,913 | 4,707 | 6,640 | 464 | 484 | 651 |
| 1·2 සේවා .. | 565 | 643 | 822 | 67 | 66 | 79 |
| 1·3 පෞද්ගලික සංක්‍රාම .. | 60 | 109 | 120 | 7 | 11 | 12 |
| 2· **විදේශ ගෙවීම** .. | **7,599** | **7,915** | **8,441** | **899** | **813** | **834** |
| 2·1 භාණ්ඩ හා සේවා .. | 5,851 | 6,001 | 6,813 | 693 | 617 | 678 |
| 2·2 ප්‍රාග්ධන ආපසු ගෙවීම .. | 1,748 | 1,914 | 1,628 | 206 | 196 | 156 |
| 3· විදේශීය සම්පත් පරතරය .. | –3,061 | – 2,456 | – 859 | –361 | – 252 | – 92 |
| 4· **හිඟය පියවීම** .. | **+3,061** | **+2,456** | **+ 859** | **+361** | **+252** | **+ 92** |
| 4·1 දිගුකාලීන ණය[2] .. | 886 | 943 | 1,184 | 105 | 96 | 114 |
| 4·2 පරිත්‍යාග .. | 541 | 492 | 490 | 64 | 51 | 47 |
| 4·3 වෙළඳ ණය[3] .. | 1,091 | 1,266 | 360 | 129 | 130 | 34 |
| 4·4 බැංකු ණය .. | 36 | 1 | 222 | 4 | — | — |
| 4·5 ද්විපාර්ශවීය ශේෂයන් .. | 87 | — | — | 10 | — | — |
| 4·6 ජා මූ අ. හැරගැනීම්[4] .. | 369 | 273 | 935 | 43 | 28 | 55 |
| 4·7 වෙනත්[5] .. | 28 | 59 | 119 | 4 | 7 | 11 |
| 4·8 විදේශ වත්කම .. | 55 | – 568 | –4,171 | 7 | – 59 | – 168 |
| 5· වටිනාකම් ගැලපීම්[6] .. | — | — | 1,680 | — | — | — |
| 6· වැරදි හා අත්හැරීම් .. | – 32 | – 10 | 40 | – 5 | – 1 | – 1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1· කාලය අනුව බර තබන ලද සාමාන්‍ය වටිනාකම වි. හැ අ. ඒකක එකක් 1975 දී රුපියල් 8·44 ක් 1976 දී රුපියල් 9·73 ක් සහ 1977 දී රුපියල් 10·42 කි·
2· යෝජනාක්‍රම, ද්‍රව්‍ය, ආහාර හා අනිකුත් ආධාර.
3· සැපයුම්කරුවන්ගේ සහ කෙටිකාලීන වෙළඳ ණය.
4· තෙල් සහනාධාර හැරගැනීම් ඇතුළුව.
5· පෞද්ගලික ප්‍රාග්ධනය ඇතුළුව.
6· විදේශ විනිමය අනුපාතිකය වෙනස්වීම අනුව ගණන් බලන ලද විදේශීය වත්කම් වැඩිවීම.

වෙළඳ අනුපාතයෙහි වර්ධනය හේතු කොට ගෙන විදේශ සම්පත් පරතරය 1976 දී වි. හැ. අ. දශ ලක්ෂ 252 සිට 1977 දී වි. හැ. අ. දශ ලක්ෂ 92 දක්වා අඩුවිය. මෙම හිඟය පියවීමේ දී සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි 1977 දී වි. හැ. අ. දශ ලක්ෂ 261 ක විදේශ සම්පත් ලබා ගන්නා ලද අතර, එය වි හැ. අ. දශ ලක්ෂ 169 ක විදේශ වත්කම් ඉහළ යාමකට හේතු විය දිගුකාලීන ණය සහ පරිත්‍යාග වි. හැ. අ. දශ ලක්ෂ 14 කින් වැඩි වූ අතර කෙටිකාලීන ණය ගැනීම් වි හැ. අ. දශ ලක්ෂ 96 කින් තියුණු ලෙස අඩුවෙමින් 1977 දී දිගුකාලීන ණය ගැනීම් සඳහා වැඩි රුචියාවක් පෙන්නුම් කෙරිනි. රුපියල් දශ ලක්ෂ 1,680 ක් වන අගැයීම් ගැලපිලි අනුව විදේශ වත්කම්වල වැඩිවීමෙන් සියයට 30 ක් පමණ දේශීය හා ජාත්‍යන්තර මුදල් වල වටිනාකම් වෙනස්වීමෙන් සිදු වූ බව පෙනේ.

නො පියවන ලද මුලු විදේශීය ණය ප්‍රමාණය 1976 දී රුපියල් දශ ලක්ෂ 6,826 සිට 1977 දී රුපියල් දශ ලක්ෂ 13,321 දක්වා දෙගුණයකටත් වඩා වැඩිවිය. මීට පෙර නොවූ මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විනිමය අනුපාතික වෙනස්කමය. වි. හැ. අ ඒකක අනුව ගණනය කරන විට විදේශ ණය වි. හැ. අ. දශ ලක්ෂ 666 සිට වි. හැ. අ. දශ ලක්ෂ 705 දක්වා සියයට 6 ක වැඩිවීමක් පමණක් පෙන්නුම් කරයි. විදේශ ණය සේවා අනුපාතය (එනම්, ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම්, මුලු විදේශීය ඉපයීම් වල අනුපාතයක් ලෙස ගණන් ගැනීම) 1976 දී සියයට 20·1 සිට 1977 දී සියයට 18·5 දක්වා අඩු විය.

ශ්‍රී ලංකාවේ රුපියලෙහි අගය 1977 දී නිරතුරුවම වෙනස් විය. 1977 මුල දී ශ්‍රී ලංකා රුපියල ජාත්‍යන්තර මුදල් වර්ග කිහිපයකට ඈඳා තිබූ අතර, මාර්තු මුල දී විනිමය අනුපාතිකය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයක් රුපියල් 8·72 ක් විය. මාර්තු මස 12 වන දින රුපියල දළ වශයෙන් සියයට 20 කින් ප්‍රති අගය කරන ලද අතර, ඒ අනුව විනිමය අනුපාතිකය ඇ. එ ජ. ඩොලරයක් රුපියල් 7·28 ක් විය. එසේ වුව ද, මෙම සංශෝධනය සනාථ කරන පරිදි ගෙවුම් තුලනයෙහි මූලික දිගුකාලීන වර්ධනයක් පෙනෙන්නට නොතිබුණි. අගෝස්තු වන විට මෙම තත්ත්වය නිවැරදි කිරීමට නව රජය විසින් තීරණය කරන ලද අතර, ඒ අනුව නොවැම්බර් 15 වන දින දක්වා රුපියලේ අගය ක්‍රමානුකූලව අඩුවීමට ඉඩ හරින ලදී. එම දිනයේ දී නිල විනිමය අනුපාතිකය සහ අතිරේක විනිමය අනුපාතිකය (විවිහිස) ඒකාබද්ධ කරන ලද අතර, ආරම්භයේ දී රුපියලේ වටිනාකම ඇ. එ. ජ. ඩොලරයක් රුපියල් 16 ක් ලෙස නියම කරන ලදී. ඉන්පසු, වෙළඳ පොල අනුව වටිනාකම නියමවන සැටියට රුපියල පාවීමට ඉඩහරින ලදී. වෙළෙඳ බැංකුවල තැන් මිලදී ගැනීමේ හා විකිණීමේ අනුපාතිකයන් දිනපතා පැවැත්වෙන බැංකු කරුවන්ගේ රැස්වීමක දී තීරණය කරනු ලැබේ. මෙම ක්‍රමය ආරම්භයේ දී ඇ. එ. ජ. ඩොලරයක මිලදී ගැනීමේ හා විකිණීමේ අනුපාතිකයන් පිළිවෙලින් රුපියල් 15·97 ක් හා රුපියල් 16·03 ක් විය. දෙසැම්බර් අවසානය වන විට මෙම අනුපාතිකයන් ඩොලරයක් රුපියල් 15·53 ක් හා රුපියල් 15·59 ක් වශයෙන් වෙනස්වී තිබුණි.

## රජයේ මුදල් පරිහරණය

1977 දී රජය තම මුදල් පරිහරණ කටයුතු මගින් රටේ ආර්ථික ක්‍රියාවලියට රුපියල්, දශලක්ෂ 716 ක සංකෝචනාත්මක බලපෑමක් ඇතිකර ඇත. පසුගිය වර්ෂ දෙකේදීම එනම් 1976 දී රුපියල්දශ ලක්ෂ 605 කින් සහ 1975 දී රුපියල් දශලක්ෂ 184 කින් කරන ලද උද්ධමනකාරි මූල්‍යකරනයකින් පසුව ඇතිවූ මෙම බලපෑම, මිල මට්ටම පහළ හෙළීමට තුඩු දුන් බව නිසැකවම කිව හැකිය. වෙන් කර තිබූ මුදල් වැය නොකිරීම මගින්, උද්ධමනය අඩු කරවන සහනදායී බලපෑමක් ඇති කිරීම, අගය කරන අතරම, එයට මග පෑදූ, වෙන්කළ ප්‍රාග්ධන වියදම්වල අසතුටු දයක උපයෝජනය පිළිබඳවද සඳහන් කළ යුතුමය.

රජයේ වියදම් පිළිබඳ තාවකාලික සංඛ්‍යා සැසඳීමේදී ඉහත වර්ෂයට වඩා සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1970 සිට සිදුවී ඇති සියයට 16 ක සාමාන්‍ය වාර්ෂික වැඩිවීමත් සමග සසඳන කල මෙම වැඩිවීම ආන්තික වැඩිවීමකි. 1977 දී වියදම අඩුවීම ප්‍රාග්ධන වැය අඩුවීමකට පමණක් සීමා විය. පුනරාවර්තන වියදම් සියයට 11 කින් වැඩිවී ඇතත්, එය